**ශීර්ෂය 250 - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 250 - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජූනි 22 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ---------------------------- | -------------- |
| (අ) | පුනරාවර්තන වැය විෂයයන් 3 ක් සහ මූලධන වැය විෂයයන් 02 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා ගැනීම හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට එකතුව රු.1,540,956 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණු අතර එය එක් එක් වැය විෂයයන්ගේ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 29 සිට සියයට 87 දක්වා වූ පරාසයක විය. | වියදම් පාලනය කිරීම සහ අරපිරිමැසුම්දායක ලෙස වත්කම් පරිහරණය කිරීම හේතුවෙන් අපේක්ෂා කළ පරිදි වියදම් ඇති නොවීම සහ අන්තර් කාල සීමාව සඳහා රාජ්‍ය ආයතනවලට ගැලපෙන පරිදි වෙනස් කරන ලද ගිණුම්කරණ ප්‍රමිතීන් (Customized Accounting Standards) සඳහා නියමිත අනුමැතිය නොලැබීම හේතුවෙන් (ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපත්තිමය තීරණයකට නොඑළඹීම නිසා), සැලසුම් කළ පරිදි කාර්යය නිම කිරීමට නොහැකි වීම. | මු.රෙ. 50 විධිවිධාන ප්‍රකාරව වාර්ෂික වියදම් ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව පිළියෙල කළ යුතු වීම. |
| (ආ) | 250-1-1-0-1201 වැය විෂයෙහි ප්‍රතිපාදන ඉතිරිව තිබියදී රු.90,000 ක ප්‍රතිපාදනයක් මු.රෙ.66 මඟින් ලබා ගෙන තිබුණු නමුත් 2022 දෙසැම්බර් 31 දින වන විට මෙම වැය විෂයෙහි රු.242,589 ක් ඉතිරිව තිබුණි. | 2022 වර්ෂයේදී ටෝනර් මිලදී ගැනීම සඳහා රු.391,325 ක වටිනාකමකින් යුත් ඇණවුමක් ලබා දී තිබුණද, අදාල ආයතනයේ තොග අවසන් වී තිබීම හේතුවෙන් 2022 වසර තුළදී දෙපාර්තමේන්තුව වෙත ලැබී තිබුණේ රු.149,825 ක ටෝනර් පමණි. එබැවින් 2023 වර්ෂයේ දී තොග ලැබීමත් සමග ඉතිරි වටිනාකම ගෙවීම් කිරීමේ පරමාර්ථයෙන් 2022 වසර සඳහා ඇතිකර ගත් බැඳීම් වෙනුවෙන් අවශ්‍ය ඉතිරි ප්‍රතිපාදන වන රු.241,500 ක් මු.රෙ. 66 යටතේ ප්‍රතිපාදන මාරු කර ගැනීම මගින් සලසා ගෙන තිබුණි. | මු.රෙ. 50 විධිවිධාන අනුව වාර්ෂික වියදම් ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව පිළියෙල කළ යුතු වීම |

## 2.2 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

### 2.2.1 විවිධ අත්තිකාරම් ගිණුම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට විවිධ අත්තිකාරම් ගිණුමේ හිඟ ශේෂය තුළ වර්ෂ 05 ට වැඩි කාලයක සිට පැවත එන රු.129,556,557 ක ශේෂයක් වූ අතර, එම ශේෂයෙන් සියයට 88 ක් පොළොන්නරුව, අනුරාධපුරය සහ අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලින් අයවිය යුතුව පැවතුණි. එම හිඟ හිටි අත්තිකාරම් වටිනාකම් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. | 2022.12.31 දිනට විවිධ අත්තිකාරම් ගිණුමේ ශේෂයෙන් වසර 05කට වැඩි අත්තිකාරම් ශේෂය ලෙස දක්වා ඇති රු.129,556,557 ක මුදල නිවැරදිය. එම ශේෂයෙන් සියයට 88ක ප්‍රමාණයක් පොළොන්නරුව, අනුරාධපුර හා අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලින් අයවිය යුතු ශේෂ වන අතර එම ශේෂ නිරවුල් කර ගැනීම සඳහා ගෙන ඇති පියවර හා ගැනීමට යෝජිත ඉදිරි ක්‍රියාමාර්ග වාර්තා කර තිබුණි. | පසුවිපරම් කටයුතු විධිමත් කරමින් හිඟ ශේෂ අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් ඉදිරි පියවර ගත යුතු වීම. |
| (ආ) | අනුරාධපුර ශික්ෂණ රෝහලේ 2019 මාර්තු 02 දින සිදුව ඇති මුදල් සොරකමක් හේතුවෙන් සිදුව ඇති පාඩුව පියවා ගැනීම සඳහා මු.රෙ. 106 ප්‍රකාරව නිදහස් කර ඇති රු.6,321,785 ක අත්තිකාරම් මුදල වසර 03 කට වැඩි කාලයක් ගත වුවද, විගණිත දිනය වන විටත් නිරවුල් කරගෙන නොතිබුණි. | අනුරාධපුර ශික්ෂණ රෝහලේ මුදල් සොරකම සම්බන්ධයෙන් නිරවුල් කළ යුතු රු.6,321,785 ක මුදල සම්බන්ධයෙන්, අනුරාධපුර ම/උ නඩු අංක බී 980/2019 යටතේ අධිකරණයට කරුණු වාර්තා කර ඇති අතර නඩුව 2019.09.06 වන දින අධිකරණයේ කැඳවීමෙන් පසු පියවර අයදීමට නියෝගකර ගොනුව බහා තබා ඇති බවත්, සැකකරු සම්බන්ධයෙන් සාර්ථක තොරතුරු අනාවරණය කර ගැනීම සඳහා ඉදිරි විමර්ශන කටයුතු සිදුකරමින් පවතින බවත්, 2023.04.04 දිනැති ලිපිය මඟින් අනුරාධපුර පොලිස් ස්ථානාධිපති අනුරාධපුර ශික්ෂණ රෝහලට දැනුම් දී ඇත. | පසුවිපරම් කටයුතු විධිමත් කරමින් අත්තිකාරම් නිරවුල් කර ගැනීම සඳහා ප්‍රමාණවත් ඉදිරි පියවර ගත යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

**(අ) රාජ්‍ය ගිණුම් ක්‍රමය වැඩිදියුණු කළ මුදල් පදනමේ සිට උපචිත පදනමට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය**

2018 අයවැය යෝජනා අංක 254 අනුව, ඉදිරි වසර 10 ඇතුලත මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම යටතේ පිළියෙල කිරීම සඳහා යෝජනා සම්මත වී තිබුණු අතර මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ------------------------------- | ------------- |
| (i). | මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම යටතේ පිළියෙල කිරීමේ ක්‍රියාවලිය සඳහා ඉදිරිපත් කළ මාර්ග සැලැස්මේ (Road Map) ඇතුළත් කාර්යයන්වලට අදාළව සිදු කරන ලද සංශෝධනයන් සඳහා 2023 මැයි 20 දින දක්වා අනුමැතිය ලබාගෙන නොතිබුණි. | සංශෝධිත මාර්ග සැලැස්ම සඳහා මෙතෙක් අනුමැතිය ලබාගෙන නොමැති අතර ඒ සඳහා මේ වන විට කෙටුම්පත් කොට ඇති කැබිනට් පත්‍රිකාව මගින් අදාළ අනුමැතිය ලබා ගැනීමට නියමිතය. | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් ඉටු කිරීමෙන් අපේක්ෂිත ප්‍රතිඵලය ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ii). | 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව, අවශ්‍ය අයවැය ප්‍රතිපාදන සලසමින් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ උප ව්‍යාපෘතියක් ලෙස මෙම කාර්යය ක්‍රියාත්මක කිරීමේදී, "අන්තර්කාලය සඳහා ගිණුම්කරණ ක්‍රමවේදයක් හඳුන්වා දී පවත්වාගෙන යාම" ඇතුළත් කර තිබුණද, ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත (SLAPSAS)/ ජාත්‍යන්තර රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත මත පදනම්ව සකස් කල ගිණුම් ප්‍රමිත ඇතුළත් ගිණුම්කරණ රාමුවක් කෙටුම්පත් කිරීම පමණක් විගණිත දිනය වන 2023 මැයි 20 දින වන විටත් සිදු කර තිබුණි. | අන්තර්කාලය සඳහා කෙටුම්පත් කරන ලද ගිණුම්කරණ රාමුව හා ගිණුම්කරණ ප්‍රමිත 15 ක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ ද, එහි සඳහන් කරුණු පිළිබඳ මෙතෙක් විගණකාධිපතිගේ නිර්දේශ ලැබී නොමැති බැවින් අදාළ ගිණුම්කරණ රාමුව හා ප්‍රමිත මේ වන විටත් කෙටුම්පත් මට්ටමේම පවතී. | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් ඉටු කිරීමෙන් අපේක්ෂිත ප්‍රතිඵලය ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (iii). | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත (SLPSAS) අංක 01 හි 28 වන ඡේදයෙහි විධිවිධාන පරිදි "මූල්‍ය ප්‍රකාශන අදාල සෑම ප්‍රමිතයකම සියළු අවශ්‍යතා සමඟ අනුකූල වන්නේ නම් මිස මූල්‍ය ප්‍රකාශනවල ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත සමඟ අනුකුල වන්නේයැයි නොදැක්විය යුතුය" යනුවෙන් සඳහන් වී ඇති බැවින් දැනට ක්‍රියාත්මක ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත (SLAPSAS) මුදල් පදනම මත අන්තර් කාලය සඳහා භාවිතා කිරීමට හා ඉන් බැහැර වීම සාධාරණීයකරණය කිරීමට ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශනවල සිදුකිරීමට හැකියාවක් නොමැති බව රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2021 සැප්තැම්බර් 21 දිනැති ලිපියෙන් | දැනට පවතින නීතිමය රාමුව තුළ අන්තර්කාලය සඳහා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත පූර්ණ වශයෙන් යොදා ගැනීමේ හැකියාවක් නොමැති බැවින්, ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත මත පදනම්ව අන්තර්කාලය සඳහා ප්‍රායෝගිකව භාවිත කළ හැකි වෙනමම ගිණුම්කරණ ප්‍රමිත 15 ක් කෙටුම්පත් කරන ලදී. | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් ඉටු කිරීමෙන් අපේක්ෂිත ප්‍රතිඵලය ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | දන්වා තිබුණද, අන්තර් කාලය සඳහා සම්පූර්ණ ප්‍රමිතියම භාවිතා නොකර තෝරාගත් ගිණුම්කරණ මාර්ගෝපදේශ පමණක් භාවිතා කිරීමට රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ කළමනාකරණය විසින් තීරණය කළ බව තාක්ෂණික උපදේශකවරයා විසින් පිළියෙල කර 2020 ජූලි 13 දින ඉදිරිපත් කරන ලද මාර්ග සැලැස්මෙහි (Deliverable 03) හි සඳහන් කර තිබුණි. | | |
| (iv). | ඉහත සඳහන් පරිදි අන්තර් කාලය සඳහා SLAPSAS භාවිතා කිරීමට හා ඉන් බැහැරවීම් සාධාරණීයකරණය කිරීමට ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් මූලා්‍ය ප්‍රකාශනවල සිදුකිරීමට හැකියාවක් නොමැති බව සඳහන් කළද, අන්තර් කාලය සඳහා පිළියෙල කර කෙටුම්පත් ගිණුම්කරණ ප්‍රමිත එනම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලින්ද බැහැර වීම් ගණනාවක් පවතින බව නිරීක්ෂණය විය. මේ අනුව SLAPSAS වලින් බැහැර වී අන්තර් කාලය සඳහා නව ගිණුම්කරණ ප්‍රමිත පිළියෙල කිරීම පදනම් විරහිත බව නිරීක්ෂණය විය. | දැනට පවතින නීතිමය රාමුව තුළ අන්තර්කාලය සඳහා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත පූර්ණ වශයෙන් යොදා ගැනීමේ හැකියාවක් නොමැති බැවින්, ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත මත පදනම්ව අන්තර්කාලය සඳහා ප්‍රායෝගිකව භාවිත කළ හැකි වෙනමම ගිණුම්කරණ ප්‍රමිත 15 ක් කෙටුම්පත් කරන ලදී. | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් ඉටු කිරීමෙන් අපේක්ෂිත ප්‍රතිඵලය ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (v). | රාජ්‍ය ගිණුම් ක්‍රමය වැඩිදියුණු කල මුදල් පදනමේ සිට උපචිත පදනමට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සහ Ernst & Young ආයතනය අතර වූ උපදේශන සේවා ගිවිසුමේ 2.3 ඡේදයේ සඳහන් විශේෂ කොන්දේසි (සංශෝධිත) අනුව, ගිවිසුම්ගත දින සිට මාස 12 කින් මෙම ගිවිසුම කල් ඉකුත් වුවද, ඒ සඳහා වූ අදාල සංශෝධන 2023 මැයි 20 දින වන විටත් සිදු කර නොතිබුණි. | පරිවර්තන ක්‍රියාවලිය පිළිබඳ කෙටුම්පත් කොට ඇති කැබිනට් පත්‍රිකාව මගින් අදාළ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව උපදේශන සේවා ගිවිසුමට අවශ්‍ය සංශෝධන කිරීමට නියමිතය. | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් ඉටු කිරීමෙන් අපේක්ෂිත ප්‍රතිඵලය ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

**(ආ) තැන්පත් ගිණුම් පවත්වාගෙන යාම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 ජූනි 24 දිනැති අංක 243/2015 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව, 6003 කාණ්ඩයේ තැන්පත් ගිණුම් ශුන්‍ය කිරීමට අපේක්ෂා කර තිබුණු අතර 2016 වර්ෂයේ සිට එම කටයුතු වාර්ෂික ඇස්තමේන්තුව හරහා සිදු කිරීමට උපදෙස් ලබා දී තිබුණි. එසේ වුවද, අංක 6003 යටතේ වන තැන්පතු ගිණුමක රු. මිලියන 10 වූ ශේෂයක් වූ අතර එම ශේෂය නිරවුල් නොකර වසර ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් පැවතුණි. | කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2007 වර්ෂයේදී ගිණුම්ගත කරන ලද මාරු පත්‍රයේ වැරදි ගිණුම් සටහනක් හේතු කරගෙන මෙම හර ශේෂය උද්ගත වී ඇති අතර, මෙම වැරදි ගිණුම්ගත කිරීම් නිවැරදි කරගැනීම පිළිබඳව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර, 2022 වර්ෂය තුළ නිවැරදි කිරීමට කටයුතු කරන ලෙස කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට උපදෙස් දී ඇත. නැවත 2022 දෙසැම්බර් මස 23 වන දින ද රැස්වීමක් පවත්වා උපදෙස් ලබාදී ඇති නමුත්, මෙතෙක් එය ඉටු නොවූ බැවින් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව ලබාදී ඇති උපදෙස් අනුව කටයුතු කරන ලෙස 2023.05.11 දින ද ලිඛිතව දන්වා යවා ඇත. | අදාළ චක්‍රලේඛ විධිවිධාන ක්‍රියාත්මක කළ යුතු වීම. |

**(ඇ) රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය ඇපකාර සංගමයේ ක්‍රියාකාරීත්වය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1947 සැප්තැම්බර් 24 දින ප්‍රසිද්ධ කරනු ලැබූ අංක 9773 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් පිහිටුවා ඇති රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය ඇපකාර සංගමය මුදල් රෙගුලාසි අංක 880 සිට 893 මඟින් පෙන්වා දී ඇති අවශ්‍යතාවය පරිදි පවත්වාගෙන යන අතර 2023 මැයි 20 දින වන විට සාමාජිකයන් 5,044 ක් වෙනුවෙන් ඇප සුරැකුම් නිකුත් කර තිබුණි. 2022 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය ඇපකාර සංගම් ගිණුමේ ශේෂය රු.594,823 ක් විය. එමෙන්ම, එක් එක් නිලධාරීන් විසින් තැබිය යුතු ඇප වටිනාකම් 2023 මැයි 20 දින වන විටත් සංශෝධනය වී නොමැති බව ද නිරීක්ෂණය විය. | රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය ඇපකාර සංගමය ඇප තැබිය යුතු රාජ්‍ය නිලධාරීන් වෙනුවෙන් පිහිටුවා ඇති එක් ආයතනයක් පමණක් වන අතර, සාමාජිකයින් සඳහා තැබිය යුතු ඇප වටිනාකම තීරණය කිරීමට නෛතික බලයක් සංගමයට නොමැත. | ඇප තැබිය යුතු එක් ආයතනයක් වන රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය ඇපකාර සංගමය විසින් යාවත්කාලීන විය යුතු අවස්ථා අදාළ බලධාරීන්ට දැනුම් දිය යුතු වීම. |

## 4. මානව සම්පත් කළමනාකරණය

### 4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය සහ තථ්‍ය කාර්ය මණ්ඩලය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------- | ------------------------- | ------------- |
| 2022 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 10 ක්, තෘතිය මට්ටමේ තනතුරු 02 ක්, ද්විතීයික මට්ටමේ තනතුරු 13 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 02 ක් වශයෙන් පුරප්පාඩු 27ක් පැවතුණි. | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශ ලේකම් හා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් වෙත මෙම දෙපාර්තමේන්තුවේ පවතින පුරප්පාඩු පිළිබඳව හා එම පුරප්පාඩු සඳහා නිලධාරීන් අනුයුක්ත කර ගැනීමේ අවශ්‍යතාව පිළිබඳව සඳහන් කරමින් ලිපි යොමු කර ඇත. | පුරප්පාඩු පිරවීමට හෝ කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |